# <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද ජාතික සමගිය හා ප්‍රතිසංධානය සදහා වන කාර්යාලය ස්ථාපිත කිරීම සදහා වූ පනතකි</u>

ශ්‍රී ලංකා ජනරජය තුළ ජීවත් වන සැම තැනැත්තෙකුට ම ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන කිසිඳු හේතුවක් මත වෙනස් කොට සැලකීම වලක්වා ගැනීම පිණිස ද,

සැම තැනැත්තෙකුටම සිය අනන්‍යතාවය රැක ගනිමින් ආත්ම අභිමානය සහ ගෞරවය ආරක්ෂා වන පරිදි සියලු ජන කොටස් අතර දිගු කාලීන ලෙස සාමයෙන් හා සංහිඳියාවෙන් ජීවත් වීම පිණිස සුදුසු පරිසරයක් නිර්මාණය කොට පවත්වාගෙන යාම පිණිස ද,

සැම තැනැත්තෙකුටම සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කරන ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම පිණිස ද,

ශ්‍රී ලංකා දේශය තුළ පවතින මානව සම්පත් ඇතුළු ස්වාභාවික සම්පත් සුරක්ෂිත ලෙස සහ නිසි පරිදි කළමණාකරණය කරමින් ජනතාව අතර, ඇති - නැති පරතරය අවම කර ගනිමින් සම්පත් සමසේ බෙදී යන පරිදි සාධාරණ සහ සමානාත්මතාවය තහවුරු කරන ලබන ආර්ථික සහ සමාජ සන්දර්භයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාම පිණිස ද,

ජාතික හා ප්‍රාදේශීය වශයෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ ආර්ථික, දේශපාලනික, සාමාජික සහ සංස්කෘතිකමය උන්නතිය සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය සාමූහිකත්වය සහ සහජීවනය වර්ධනය කරනු පිණිස ද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවනු ලබන පනතකි.

**පසුබිම:**

ශ්‍රී ලංකාව දීර්ඝකාලීන අභ්‍යන්තර ගැටුමකට මුහුනදී, එය අවසන් කල රටකි. අභ්‍යන්තර අවි ගැටුම අවසන් වුවද, ජතීන් අතර විශ්වාසය, සාමය හා සංහිඳියාව සහ අවබෝධය තහවුරු කෙරෙන වැඩපිළිවෙලක් සහ ආයතන ව්‍යුහයක් ගොඩනැන්වීමේ අභියොගයට මුහුන දීමට ශ්‍රී ලංකා රජයට සිදුවිය. එසේම, ජාතීන් අතර සාමය හා සංහිඳියාව තහවුරු කිරීම සඳහා, රජය ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳව ජාත්‍යන්තර අවධානයද දැඩිව යොමුවූ පසුබිමක, ඊට අදාල නව දේශීය යාන්ත්‍රණයක් යොජනා වූ අතර, ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වූ කාර්යාලය, එහි එක් අභ්‍යන්තර යාන්ත්‍රණයක් ලෙසින් පිහිටුවනු ලැබීය. මෙවැනි යාන්ත්‍රණයක් පිහිටුවිය යුතුය යන්න, 2011.11.11 එළි දැක්වූ <u>''උගත් පාඩම් සහ ප්‍රතිසංධානය සදහාවූ කොමිසමේ''</u>, එක් ප්‍රභල නිර්දේශයක් විය (COMMISSION OF INQUIRY ON LESSONS LEARNT AND RECONCILIATION).

**ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය (ONUR) ස්ථාපිත කිරීම පිළිබඳ නෛතික ප්‍රතිපාදනය**

ජාතික සමගි **කාර්යාලය** (ONU) අතිගරු ජනාධිපතිතුමන් යටතේ ස්ථාපිත කොට ඇත්තේ 2015 අප්‍රේල් මස 08 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව, ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2015ක් වූ මාර්තු මස 25 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය පදනම් කර ගනිමිනි. ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය (ONUR) සැලසුම් කොට ඇත්තේ 2015.12.18 වන දින අංක 1945 /41 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියාව පිළිබඳ අමාත්‍යාංශය යටතේ ය.

කෙසේවුවද, මෙම කාර්යාලය, මේ වනතුරු,පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කර නොමැත. මෙම පනත මගින් අපේක්ෂා කරන්නේ, <u>'' ජාතික සමගිය හා ප්‍රතිසංධානය සදහා වන කාර්යාලය "</u> පිහිටුවීම සඳහා පාරිමේන්තු අනුමැතිය ලබා ගැනීමයි.

**2016 සිට 2022 සැප්තැම්බර් දක්වා පහත සඳහන් වැඩසටහන් හා ව්‍යාපෘති මෙම කාර්යාලය හරහා ක්‍රියාවට නංවා තිබේ .**

- ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම,
- සමාජ ඒකාබද්ධතා අධ්‍යාපනය
- ගැටුම් විපරිවර්තනය

- මනෝසමාජීක උපකාරක ව්‍යාපෘතිය
- කලා හා සංස්කෘතික සංහිදියාව
- දැනුවත් කිරීම් හා සමාජගත කිරීම්
- සමස්ත දිස්ත්‍රික් සංවර්ධන සැළසුම් වැඩසටහන (District Development Plan) යටතේ උතුරු, නැගෙනහිර සහ ගැටුම් වලට ලක්වූ අනෙකුත් පළාත්, ආර්ථික කටයුතු සඳහා දායක කරගැනිමේ වැඩසටහන (Economic Engagement Programme)
- ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (Livelihood Development Programme).

ප්‍රධාන වශයෙන් දේශීය අරමුදල් වලින් සහ වෙනත් ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇතිව උතුරු, නැගෙනහිර සහ ගැටුම් වලට ලක්වූ අනෙකුත් පළාත් වල ජීවත්වන දහස් ගණන් ජනතාවගේ ,රාජ්‍ය සේවකයන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ හදවත් දිනාගනිමින් ඉහත ව්‍යාපෘති හරහා ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය ජාතික සංහිදියා උපාය මාර්ග තුළ ප්‍රධාන කාර්යයභාරයක් ඉටුකොට ඇත.

## a. කෙටි නාමය

''ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය ස්ථාපිත කිරීම පවත්වාගෙන යාම සහ ජාතික සමගිය හා ප්‍රතිසංධානයට අදාල ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ පනත'' ලෙසින් හැදින්වෙනු ඇත.

[ ක්‍රියාත්මක වන දිනය: 2022 ඔක්තොම්බර් xx ]

## I කොටස

මෙම පනත 2022 XX අංක දරන ජාතික සමගිය සහ ප්‍රතිසංධානය සඳහා වූ පනත වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම ආයතනය අධිකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාතමක වනු ඇත.

a) ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වූ වැඩසටහන් සැලසුම්කිරීම, සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ කාර්යාලයක් ස්ථාපිත කෙරෙන අතර එය, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වූ කාර්යාලය ලෙස හැදින්වෙනු ඇත.

b) ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වූ කාර්යාලයට සිය සංස්ථාපිත නාමය යටතේ නඩු පැවරීම් සහ පවරනු ලැබීමේ නෛතික පුද්ගලභාවයක් ඇත්තේය. එහි සංස්ථාපිත නාමය සහිත මුද්‍රාව සභාපති භාරයේ පැවතිය යුතුය.

## II කොටස

## B. ජාතික සමගිය හා ප්‍රතිසංධානය සදහා වන කාර්යාලයේ බලතල, වගකීම් හා කාර්යභාරය .

a) ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා, ජාතික වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයේ ප්‍රමුඛ වගකීම වන්නේය. එය සමාජයේ සියළු ජනකොටස් මෙන්ම, ආගමික සහ සන්ස්කෘතීන්ද වෙනසකින් තොරව අගයීමකට ලක් කෙරෙන අකාරයකින් ක්‍රියාත්මක කිරීම මෙම කාර්යාලයේ වගකීම වන්නේය. ජාතික සමගිය හා සහජීවනය ප්‍රවර්ධනය සඳහා පහත වැඩ සටහන් ක්‍රියාත්මක කල යුතුය.

b) ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය, ශ්‍රීලංකා රජය මගින් ස්ථාපිත කලේ, රට තුල, සාමය හා සංහිදියාව තහවුරු කිරීමේ දේශීය යාන්ත්‍රණයක් ලෙසිනි. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන මගින්, රට තුල සාමය හා සහජීවනය ඇතිකිරීම සඳහා පිහිටුවනු ලැබූ, එක් ප්‍රධාන දේශීය යාන්ත්‍රණයක් ලෙසින් මෙම ආයතනය පිළිගන්නා බැවින්, එම, ජාත්‍යන්තර සංවිධාන සමග සහයොගයෙන් කටයුතු කිරීමත්, අවශ්‍ය අවස්ථා වලදී, නිවැරදි වාර්ථාකරණයට සහාය දීමත් කල යුතුය.

c) ග්‍රාමීය මට්ටමේ සිට ජාතික තලය දක්වා වූ ජාතික සමගිය හා සහජීවනය සඳහා වූ වැඩසටහන්; ග්‍රාම සභා සහ ග්‍රාම රාජ්‍ය ලෙසින් ක්‍රියාත්මක වනු ලැබෙන අතර, ඒ සඳහා වූ වැඩ සටහන, ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වූ කාර්යාලය තුල ස්ථාපිත ලේකම් කාර්යාලයක් මගින් මෙහෙයවීමට නියමිතය.

d) ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන වැඩ සටහනේ එක් ප්‍රධාන මැදිහත්වීමක් වන්නේ, ග්‍රාමීය සංවර්ධන කටයුතු වල සිට ජාතික තලයේ රාජ්‍ය පාලනයේ සැලසුම් කිරීම්, ක්‍රියාත්මක කිරීම් සහ ඇගයීම් කිරීම් සඳහා වන ග්‍රාම පාලන ව්‍යුහයකට සියළු ජන කොටස් වලට ඉඩකඩ විවෘත කිරීමයි.

e) යම් පුද්ගලයෙකුගේ ජාතිය, ආගම,භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන කරුණු මත කිසිඳු වෙනසකට භාජනය නොවෙමින් සමානාත්මතාවයෙන් යුතුව සාධාරණ සමාජයක් තුළ සිය ආත්ම ගරුත්වය සහ අභිමානය සහිතව ජීවත් වීම සඳහා අවශ්‍ය වන ආර්ථික, දේශපාලනික, සමාජයීය සහ සංස්කෘතිකමය පරිසරය නිර්මාණය කර පවත්වාගෙන යාම පිණිස ජාතික වශයෙන් ක්‍රියාත්මකවන්නා වූ ජන සභාවක් සහ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන්නා වූ ග්‍රාම රාජ්‍යය ව්‍යුහයක් ස්ථාපිත කිරීම ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයේ ජාතික සහජීවන වැඩසටහන බවට පත්විය යුතුය.

f) මේ සඳහා වූ ජනසභා ලේකම් කාර්යාලයක්, ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වූ කාර්යාලය මගින් ස්ථාපිත කෙරෙන අතර, එයට, ජනසභා පාලක මණ්ඩලයක් පත්කෙරෙනු ඇත. (ජනසභා ලේකම් කාර්යාලයේ කාර්යභාරය හා සංයුතිය ඇමිනුම් අංක (1) මගින් දක්වා ඇත)

g) ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයේ මූලස්ථානය කොළඹ පිහිටුවෙනු ඇත. අවශ්‍යතාවය මත, වෙනත් ස්ථානවල උප කාර්යාල පිහිටුවීමේ හැකියාව අධ්‍යක්ශ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඔවුන්ට හිමිවේ.

h) රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසංධානයත් කල් පවත්නා සාමයත් ප්‍රවර්ධනය කිරීම සඳහා වන වැඩ පිලිවෙලක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම, ඒකාබද්ධ ප්‍රවේශයක් විය යුතු අතර සියලු සංවර්ධන පාර්ශව කරුවන් සමග සහයොගයෙන් කටයුතු කලහැකි වැඩපිලිවෙලක් සකස් විය යුතුය.

i) ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසංධානය පිළිබඳව ජාතික ප්‍රතිපතතියක් සකස් විය යුතුය.

j) ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක, සියළු ප්‍රජා මූල සංවිධාන සහ ප්‍රාදේශීය සංවර්ධන නිලධාරින්, තමන්ගේ භූගෝලීය වපසරිය තුල ජීවත් වන සියලු ජන කණ්ඩායම් වලට බේදයකින් තොරව සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය සමාජ වටපිටාව ගොඩ නංවා දීමට කටයුතු කල යුතුය. ජාතීන් අතර සාමය, සංහිදියාව, විවිධ ආගමික කණ්ඩායම් තුල අන්නෝන්‍ය විශ්වාසය සහ අනෙකාට ගරු කරන සංස්කෘතික ඒකකයක් ලෙසින් ක්‍රියාත්මක වීමට හැකි, ග්‍රාම සභා ව්යහයක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම, මෙම කාර්යාලයේ ප්‍රමුඛ කාර්ය භාරයක් වන්නේය.

k) ප්‍රතිසංධානය ප්‍රවර්ධනය කරලීම පිණිසත්, ජාතික සමඟිය ඇති කිරීම පිණිසත් වැඩසටහන් හා ව්‍යාපෘති, ක්ෂේත්‍ර මට්ටමේදී, අධීක්ෂණය හා ඇගයීම.

l) ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ඇති සියලුම තලයන්වලදී, ජාතික ඒකාබද්ධතාවය කෙරෙහි බලපාන සම්බාධක හඳුනා ගැනීම හා අදාළ පාර්ශව සමඟ පැවැත්වෙන සාකච්ඡා හා කථිකා පාදක කොට ගෙන ප්‍රතිපත්තිමය වශයෙන් පියවර ගැනීම.

m) ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධානය සඳහා සහ සාමය ගොඩනැංවීම සඳහා කටයුතු කෙරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමඟ සහභාගීත්වයෙන් ක්‍රියා කරමින් අන්තර් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගැටලු ඇතොත් ඒවා සමනය කිරීම.

n) ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධානය පිළිබඳව දැනට ක්‍රියාත්මක කෙරෙන සහ යථා කාලයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත විවිධ උපාය මාර්ග සමාලෝචනය සහ ගැටලු නිරාකරණයට මැදිහත් වීම.

o) උගත් පාඩම් හා ප්‍රතිසංධාන පරීක්ෂණ කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වූ විට මැදිහත් වීම.

p) ප්‍රතිසංධානයට හා පවත්නා සාමයක් ගොඩ නැංවීම පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සඳහා යෝග්‍ය විසඳුම් යෝජනා කිරීම පිළිබඳව රජයේ නිලධාරීන්ට උපදෙස් ලබා දීම.

q) ඉහත සඳහන් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස අරමුදල් සෙවීම.

r) ග්‍රාම සභා ව්‍යුහයන් ස්ථාපිත කිරීම සහ ඊට අදාළ වැඩසටහන් සම්පාදනය කිරීම හා අධීක්ෂණය කිරීම.

s) ජාතික අවශ්‍යතාවයන් මත ක්‍රියාත්මක කළ යුතු හා කඩිනම් අවධානයට ලක් විය යුතු ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂ වැඩසටහන්වලට දායක වීම.

t) අතිගරු ජනාධිපතිතුමා විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂ ව්‍යාපෘති, අදාළ අනෙකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම.

u) විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් අමාත්‍යවරුන්ට සහ වැඩසටහන්වලට සහාය වීම සහ සම්බන්ධීකරණය කටයුතු සිදු කිරීම.

v) ප්‍රාදේශීය සංවර්ධන ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ කටයුතු සිදු කිරීම හා ප්‍රාදේශීය ආර්ථික විෂමතාවන් අවම කිරීමට කටයුතු කිරීම.

**a) ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය, සංයුතිය;**

a. ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයේ, සංයුතිය අධ්‍යක්ෂවරු 15 කින් සමන්විත වේ. සභාපතිවරයා, අධ්‍යක්ෂ වරුන් අතුරින් තොරා ගනු ලැබේ. සියළු පත්වීම්, ඇමතිතුමාගේ නිර්දේශයෙන් අතිගරු ජනාධිපති විසින් සිදුකරනු ඇත.
b. අධ්‍යක්ෂ ජනරාල් වරයා ආයතනයේ, ප්‍රධාන විධායක වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුද වේ.
c. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් පත්කිරීමේදී, අදාල සාමාජිකයන්, සමාජයේ විවිධ ශේස්ත්‍ර නියොජනය කරන, සහ සියළු ජාතීන් නියොජනය කරන අය වීම සැලකිල්ලට ගතයුතු අතර කාන්තා හා පුරුෂ පක්ෂයට සම අවස්ථාවක් ලබා දීමට උත්සාහ ගත යුතුය.

**b) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නිල කාලය.**

a. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ස්ව කැමැත්තෙන් ඉල්ලා අස්වීමෙන් හො ඇමතිවරයා විසින් ඉවත් කිරීමෙන් හො පුරප්පාඩු වූවොත් මිස සාමාජිකයෙකුගේ ධූර කාලය වසර 3 ක් වනු ඇත.

**7. Meetings of ONUR.**

.

**9. Quorum.**

**11. General Powers of the ONUR.**

**PART III**

<u>ඇමුණුම 1</u>

**<u>ජනසභා ලේකම් කාර්යාලයක් ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය තුල ස්ථාපනය කිරීම.</u>**

ශ්‍රී ලංකා ජනරජය තුළ ජීවත් වන සෑම තැනැත්තෙකුට ම ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන කිසිඳු හේතුවක් මත වෙනස් කොට සැලකීම වලක්වා ගැනීම පිණිස ද,

සෑම තැනැත්තෙකුටම සිය අනන්‍යතාවය රැක ගනිමින් ආත්ම අභිමානය සහ ගෞරවය ආරක්ෂා වන පරිදි සියලු ජන කොටස් අතර දිගු කාලීන ලෙස සාමයෙන් හා සංහිඳියාවෙන් ජීවත් වීම පිණිස සුදුසු පරිසරයක් නිර්මාණය කොට පවත්වාගෙන යාම පිණිස ද,

සෑම තැනැත්තෙකුටම සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කරන ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම පිණිස ද,

ශ්‍රී ලංකා දේශය තුළ පවතින මානව සම්පත් ඇතුළු ස්වාභාවික සම්පත් සුරක්ෂිත ලෙස සහ නිසි පරිදි කළමණාකරණය කරමින් ජනතාව අතර, ඇති - නැති පරතරය අවම කර ගනිමින් සම්පත් සමසේ බෙදී යන පරිදි සාධාරණ සහ සමානාත්මතාවය තහවුරු කරන ලබන ආර්ථික සහ සමාජ සන්ධර්භයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාම පිණිස ද,

ජාතික හා ප්‍රාදේශීය වශයෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ ආර්ථික, දේශපාලනික, සාමාජික සහ සංස්කෘතිකමය උන්නතිය සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය සාමූහිකත්වය සහ සහජීවනය වර්ධනය

කරනු පිණිස ද ජනසභා ලේකම් කාර්යාලයක් ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය තුල ස්ථාපනය කෙරෙනු ඇත.

**ජනසභා ලේකම් කාර්යාලයේ කාර්යභාරය;**

1. යම් පුද්ගලයෙකුගේ ජාතිය, ආගම,භාෂාව, කුලය, ලිංග භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන කරුණු මත කිසිඳු වෙනසකට භාජනය නොවෙමින් සමානාත්මතාවයෙන් යුතුව සාධාරණ සමාජයක් තුළ සිය ආත්ම ගරුත්වය සහ අභිමානය සහිතව ජීවත් වීම සඳහා අවශ්‍ය වන ආර්ථික, දේශපාලනික, සමාජයීය සහ සංස්කෘතිකමය පරිසරය නිර්මාණය කර පවත්වාගෙන යාම පිණිස ජාතික වශයෙන් ක්‍රියාත්මකවන්නා වූ ජන සභාවක් සහ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන්නා වූ ග්‍රාම රාජ්‍යයන් පිහිටුවිය යුත්තේය.

2. ශ්‍රී ලංකා ජන සභාවට සිය සංස්ථාපිත නාමය යටතේ නඩු පැවරීම් සහ පවරනු ලැබීමේ නෛතික පුද්ගලභාවයක් ඇත්තේය. එහි සංස්ථාපිත නාමය සහිත මුද්‍රාව සභාපති භාරයේ පැවතිය යුතුය.
3. ශ්‍රී ලංකා ජන සභාව සාමාජිකයන් 15 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර එම සාමාජිකයන් ව්‍යවස්ථාදායක සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේය.
4. ශ්‍රී ලංකා ජන සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේය.
5. ශ්‍රී ලංකා ජනසභාවට සාමාජිකයන් පත්කිරීමේදී සමාජ බහුවිධභාවය පිළිබිඹු වන පරිද්දෙන් සහ සාධාරණ ලෙස තරුණ හා කාන්තා නියෝජනය තහවුරු කළයුතු අතර ඔවුන් ක්‍රියාකාරී දේශපාලනයේ නොයෙදෙන සමාජයේ විශ්වාශයට සහ ගරුත්වයට පාත්‍ර වූවන් විය යුතුය.
6. ශ්‍රී ලංකා ජන සභාවට පත්කරනු ලබන සාමාජිකයෙකු වසර පහක කාලයක් ධූර දරනු ලබන අතර ධූර දරනු ලබන අතර ධූර දරන්නාගේ වයස අවුරුදු 70 නොඉක්මවිය ක් විය යුත්තේය.
7. ශ්‍රී ලංකා ජන සභාවේ සාමාජිකයෙකුට සිය අත්සනින් ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මඟින් ඉල්ලා අස්විය හැක්කේය.

8. ශ්‍රී ලංකා ජන සභාවේ සාමාජිකයෙකු,

   අ) මියගියහොත් හෝ

   ආ) ඉල්ලා අස්වීමෙන් හෝ

   ඇ) අපරාධ වරදකට සිර දඬුවමකට යටත් වන්නේය නම් හෝ

   ඇ) ඔහුගේ අයහපත් ක්‍රියාකලාපය හේතුකොටගෙන ඉවත්කළයුතු යැයි ව්‍යවස්ථාදායක සභාව විසින් නිර්දේශ කරනු ලැබුවහොත් ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීමෙන් හෝ සාමාජිකයෙකුගේ ධූර දැරීම අවසන් වන්නේය.

9. එසේ යම් සාමාජිකයෙකු ධූර දැරීම නතර වුවහොත් එම සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය සඳහා වෙනත් සාමාජිකයෙකු ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපත්වරයා විසින් පත් කළ යුත්තේය.

10. ශ්‍රී ලංකා ජන සභාවේ ස්ථාපිත කොට පවත්වාගෙන යාමේ අරමුණු පහත සඳහන් පරිදි වන්නේය.

අ) සෑම තැනැත්තෙකුට ම ජාතිය, ආගම, භාෂාව,කුලය,ලිංග භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යනාදී කරුණු මත කිසිඳු වෙනසකට භාජනය නොවෙමින් සිය අනන්‍යතාවය සහිතව ආත්ම ගරුත්වය සහ අභිමානයෙන් යුතුව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර පවත්වාගෙන යාම.

ආ)සෑම තැනැත්තෙකුට සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කරන ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවයන් පවත්වාගෙන යමින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට සහ රටේ සංවර්ධනයට දායක වීම.

ඇ) රටේ පවතින මානව සම්පත් සහ ස්වාභාවික සම්පත් සුරක්ෂිත කොට කළමණාකරණය කරමින් ජනතාව අතර ඇති - නැති පරතරය අවම කරගෙන සමාජ තලය සාධාරණ ලෙස බෙදෙන පරිදි සමානාත්මතාවය තහවුරු කිරීම.

ඈ) රටේ මූලික නීතිය සහ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳව ජනතාව තුළ අවබෝධයක් ඇති කිරීම.

ඉ) සමාජය නීතිගරුක බවට පත් කිරීම පුරවැසියන් සභාත්වයෙන් පිරි නීති ගරුක පුරවැසියන් බවට පත් කිරීම.

ඊ) ඉහත සඳහන් අරමුණු සාක්ෂාත්කර ගැනීම පිණිස ග්‍රාම රාජ්‍ය සංවිධාන පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

උ) ග්‍රාම රාජ්‍ය ආරම්භකර පවත්වාගෙන යාමට අවශ්‍ය නිර්ණායක සහ උපදෙස් ලබා දීම.

ඌ) ශ්‍රී ලංකා ජන සභාව සහ ප්‍රාදේශීය මට්ටමෙන් පිහිටුවා පවත්වාගෙන යනු ලබන ග්‍රාම රාජ්‍ය සමඟ අන්තර් සම්බන්ධතාව පවත්වාගෙන යමින් මෙම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීස සඳහා පියවර ගැනිම.

එ) මෙම පනතෙහි අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව රජයට උපදෙස් ලබා දීම.

11. ශ්‍රී ලංකාව තුළ පවතින ග්‍රාම සේවක වසම් අතරින් යාබදව ඇති ග්‍රාම සේවා වසම් තුනක් එකතු කර ''ග්‍රාම රාජ්‍ය'' නම් වූ සංවිධානයක් පිහිටවිය යුත්තේය.

12. සුවිශේෂී හේතූන් මත ග්‍රාම සේවක වසම් දෙකක් එක්කර ග්‍රාම රාජ්‍යයක් පිහිටුවිය හැකි අතර ප්‍රාදේශීය ලේකම්වරයා එම තීරණය ගැනීමේ බලධාරියා විය යුතුය.

13. ග්‍රාම රාජ්‍ය සංවිධානයට එම ග්‍රාම සේවා වසමට අදාළ නම අගට යොදා ග්‍රාම රාජ්‍ය නාමය භාවිතා කළ යුතු අතර එම ග්‍රාම රාජ්‍ය නාමයෙන් ස්ථාපිත ආයතනයක් ලෙස නඩු පැවරීමට සහ පවරනු ලැබිය හැකි නෛතික පුද්ගලභාවයක් දරන්නේය. එහි සංස්ථාපිත නාමය සහිත මුද්‍රාව සභාපති භාරයේ පැවතිය යුතුය.

14. ග්‍රාම රාජ්‍ය තුළ නිත්‍ය වාසය ඇති වයස අවුරුදු 18 ට වැඩි පවුල් ඒකකයක ගෘහ මූලිකයා හෝ ඔහු නම් කරනු ලබන පවුලේ වෙනත් සාමාජිකයෙකු හට සාමාජික මුදලක් ගෙවීමෙන් තොරව ග්‍රාම රාජ්‍ය සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත හැකිය.

15. ග්‍රාම රාජ්‍යයට සාමාජිකයන් බඳවා ගැනීම අදාළ ග්‍රාම සේවා කොට්ඨාසයේ ග්‍රාම සේවක නිලධාරියා විසින් සිදු කළ යුතු අතර මෙම පනත යටතේ පනවනු ලබන රෙගුලාසිවලට අනුව ප්‍රාදේශීය ලේකම්ගේ සහභාගීත්වයෙන් නිලධාරී මණ්ඩලයක් තෝරා පත් කර ගත යුතුය.

16. ග්‍රාම රාජ්‍යයේ සාමාජිකයන් අතරින් සභාපති,ලේකම් හා භාණ්ඩාගාරික පත් කර ගත යුතු අතර එකඟතාවක් නොමැත්තේ නම් සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුය.

17. එකී නිලධාරීන්ට අමතර ලෙස කාරක සභාව සඳහා තවත් සාමාජිකයන් 6 දෙනෙකු පත් කර ගත යුතු අතර එකඟතාවක් නොමැත්තේ නම් සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුය.

18. ග්‍රාම රාජ්‍යයේ උපදේශකයන් හයදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් විය යුතු අතර එම ග්‍රාම රාජ්‍යය තුළ පිහිටි ආගමික සිද්ධස්ථානවල නායක භික්ෂූන් වහන්සේලාට, පූජකතුමන්ලාට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

19. ඉහත කී සියලු තෝරා පත් කර ගැනීම් ප්‍රාදේශීය ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු වේ.

20. ග්‍රාම රාජ්‍යයට නිලධාරීන් තෝරා පත් කර ගැනීමේදී බහුවිධ ජන සමාජයේ සියලු කොටස් ද, තරුණ සහ කාන්තා නියෝජනය ද ප්‍රමාණවත් ලෙස සිදුවන පරිද්දෙන් කළ යුත්තේය.

21. ග්‍රාම රාජ්‍යයෙහි සියලු නිලධාරීන් සහ සාමාජිකයන් කිසිදු අයකිරීමකින් තොරව සියලු සේවාවන් ස්වෙච්ඡාවෙන් සිදු කළ යුතුය.

22. මෙම පනත යටතේ පිහිටුවනු ලබන සියලුම ග්‍රාම රාජ්‍යය පිහිටවූ දින සිට මාස තුනක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු වේ.

23. නිලධාරී මණ්ඩලයේ සිදුවන වෙනස්කමක් එම වෙනස සිදු වී මසක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු වේ.

24. පහත සඳහන් තැනැත්තන් ග්‍රාම රාජ්‍යයක නිලධාරී මණ්ඩලයේ හෝ උපදේශක තනතුරක නිලතල දැරීමට නුසුදුසු වන්නේය.

අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු,

ආ) පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු,

ඇ)පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු,

ඈ) කිසියම් දේශපාලන පක්ෂයක හෝ ශාඛාවක සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරිකයකු,

ඉ)කිසියම් අපරාධයකට අධිකරණයකින් වරදකරු කර සිරදඬුවම් ලබා ඇති තැනැත්තෙකු,

ඊ)වයස අවු.70 ට වැඩි අයකු (උපදේශකවරයෙකු හැර)

25. ග්‍රාම රාජ්‍යයකට පත් කර ගනු ලබන උපදේශකවරයෙකු, නිලධාරියෙකු සහ කාරක සභා සභිකයෙකු පත් වූ දින සිට වසර හතරක කාලයක් ධූර දරන්නේය.

26. ඉහත ඡේදයේ සඳහන් නිලයක් දරන්නෙකුට සිය අත්සන යටතේ ග්‍රාම සේවක වෙත යවනු ලබන ලිපියක් මඟින් ඉල්ලා අස්විය යුතුය.

27. එකී නිලධාරියකු මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ 25 වන වගන්තියේ සඳහන් යම් නුසුදුසුකමකට භාජනය වන්නේ නම් හෝ එකී හිස් වූ තනතුරෙහි ඉතිරි කාල සීමා සඳහා නව නිලධාරියකු පත්කර ගත යුතු වේ.

29. පනතේ අරමුණු ඉටුකර ගැනීමෙහි ලා කටයුතු කිරීමේ දී ;

අ) සංස්ථාපිත නාමය යටතේ ගිවිසුම්ගත වීමට,

ආ) නිශ්චල හෝ චංචල දේපළ හිමිකම සහ සන්තකය දැරීමට,

ඇ) රජයේ සහ පෞද්ගලික ආයතනයන්ගෙන් මූල්‍යමය ආධාර ලබා ගැනීමට,

ඈ) කුමන ආකාරයේ හෝ බැංකු ගිණුමක් පවත්වාගෙන යාමට,

ඉ) මුදල් ඉපයීමේ පොදු ව්‍යාපෘති ආරම්භකොට පවත්වාගෙන යාමට,

ඊ) ප්‍රාග්ධනය ලබා ගැනීමට සහ ආයෝජනය කිරීමට,

උ) කෘෂිකාර්මික, කාර්මික සහ වෙළඳ ව්‍යාපෘති ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට,

ඌ) ජනතාවගේ ජීවන මට්ටම ඉහළට ගෙන යාම සඳහා සමාජ සුභසාධක කාර්යයන් සිදු කිරීමට,

එ) සමාජයීය සහ සංස්කෘතික ගුණාංග ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීමට බලය ඇත්තේය.

30. ග්‍රාම රාජ්‍යයක අරමුණු පහත සඳහන් පරිදි විය යුත්තේ ය.

අ) ග්‍රාමය සියලු ජනකොටස් අතර සාමය සහ සංහිඳියාව වර්ධනය කිරීම.

ආ) ග්‍රාමය තුළ සියලු පවුල් ඒකකයන්හි සාමාජිකයන්ට ගෞරවනීය ලෙසත්, සුරක්ෂිත ලෙසත්, අධ්‍යාත්මික ලෙසත් ජීවත් වීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

ඇ) ග්‍රාමය තුළ වසන ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම ඇතුලු කළමනාකරණ ව්‍යාපෘතීන් පවත්වාගෙන යාම.

ඈ) රජය විසින් ග්‍රාමය තුළ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් ඇතුළු අනෙකුත් ව්‍යාපෘතී සම්බන්ධයෙන් ප්‍රමුඛතාවන් හඳුනාගෙන උපදෙස් ලබා දීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි ලා සහාය වීම.

ඉ) අපරාධ, දූරාචාර, මත්ද්‍රව්‍ය භාවිතය මැඩලීම සඳහා පොලීසිය ඇතුළු නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ එම ආයතන වලට සහාය දැක්වීම.

ඊ) හදිසි අවස්ථාවල දී සහ ආපදා අවස්ථාවල දී ග්‍රාමයෙහි ජනතාවගේ උපරිම ආරක්ෂාව සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

උ) අධ්‍යාත්මික ගුණ වගාව සඳහා ළමා සහ තරුණ පරපුර ධෛර්යමත් කිරීම සහ දහම් අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම.

ඌ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

එ) ග්‍රාමයෙහි ජනතාව තුළ මතුවන ගැටුම් සහ මත ගැටුම් සමනයකර සාමය සහ සමඟිය ආරක්ෂා කිරීම.

ඒ) ග්‍රාමයෙහි ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක කමිටු ක්‍රියාත්මක කිරීම.

ඔ) ග්‍රාමයෙහි පොදු කටයුතු වෙනුවෙන් ශ්‍රමදාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ඕ) ඉහත කී අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

31. ග්‍රාම රාජ්‍ය විසින් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට තීරණය කළ ව්‍යාපෘතීන් සඳහා සාමාජිකයන් අතුරෙන් කමිටු පත් කිරිමට නිලධාරි මණ්ඩලයට බලය ඇත්තේය.

32. ග්‍රාම රාජ්‍යය සංවිධානයේ රැස්වීම් සහ සාකච්ඡා සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂා එකකින් හෝ වැඩි ගණනකින් පවත්වාගෙන යා හැකි අතර එම සංවිධානය විසින් එකඟවන පරිදි එය සිදුකළ යුත්තේය. එම ආකාරයෙන්ම ඉහත කී කුමන හෝ භාෂාවකින් රැස්වීම් වාර්තා පවත්වාගෙන යා හැකිය.

33. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අවස්ථානෝචිත පරිදි යාබදව පිහිටි ග්‍රාම රාජ්‍ය සංවිධාන දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වී ක්‍රියාත්මක කළ හැකි අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය ඇතිව වඩිමත් පූර්ව ගිවිසුම් ගතවීමක් සිදුකළ යුතු ය.

34. ග්‍රාම රාජ්‍ය විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුම් පිළිබඳ වාර්තාවක් තුන් මසකට වරක් ග්‍රාම සේවක නිලධාරි මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර වසර අවසානයේ වාර්ෂික ගිණුම් වාර්තාව ඉදිරිපත් කළ යුතු ය. එය විගණනයට ලක්කළ යුතු ය.

35. මෙම පනතේ කාර්යයන් සඳහා;

‘ග්රාමසේවක වසම‘ යන්නට රාජ්‍ය පරිපාලනය සඳහා නිශ්චය කරගෙන ඇති ග්‍රාමසේවක වසමක් අදහස් වේ.

‘ප්‍රාදේශීය ලේකම්‘ යන්නට අදාළ ග්‍රාම රාජ්‍ය පිහිටි ප්‍රදේශය අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අදහස් වේ.

‘ගෘහ මූලිකයා‘ යන්නට පවුල් ඒකකයක ප්‍රධානියා අදහස් වේ.

a) ශ්‍රී ලංකා ජනසභා පාලක මණ්ඩලය, සාමාජිකයන් 15 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර එම සාමාජිකයන් ව්‍යවස්ථාදායක සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේය.
b) ශ්‍රී ලංකා ජන සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේය.
c) ශ්‍රී ලංකා ජනසභාවට සාමාජිකයන් පත්කිරීමේදී සමාජ බහුවිධභාවය පිළිබිඹු වන පරිද්දෙන් සහ සාධාරණ ලෙස තරුණ හා කාන්තා නියෝජනය තහවුරු කළයුතු අතර ඔවුන් ක්‍රියාකාරී දේශපාලනයේ නොයෙදෙන සමාජයේ විශ්වාශයට සහ ගරුත්වයට පාත්‍ර වූවන් විය යුතුය.

1. ශ්‍රී ලංකා ජන සභාවට පත්කරනු ලබන සාමාජිකයෙකු වසර පහක කාලයක් ධූර දරනු ලබන අතර ධූර දරනු ලබන අතර ධූර දරන්නාගේ වයස අවුරුදු 70 නොඉක්මවිය ක් විය යුත්තේය.

2. ශ්‍රී ලංකා ජන සභාවේ සාමාජිකයෙකුට සිය අත්සනින් ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මඟින් ඉල්ලා අස්විය හැක්කේය.

3. ශ්‍රී ලංකා ජන සභාවේ සාමාජිකයෙකු,

අ) මියගියහොත් හෝ

ආ) ඉල්ලා අස්වීමෙන් හෝ

ඇ) අපරාධ වරදකට සිර දඬුවමකට යටත් වන්නේය නම් හෝ

ඈ) ඔහුගේ අයහපත් ක්‍රියාකලාපය හේතුකොටගෙන ඉවත්කළයුතු යැයි ව්‍යවස්ථාදායක සභාව විසින් නිර්දේශ කරනු ලැබුවහොත් ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීමෙන් හෝ සාමාජිකයෙකුගේ ධුර දැරීම අවසන් වන්නේය.

4. එසේ යම් සාමාජිකයෙකු ධූර දැරීම නතර වුවහොත් එම සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය සඳහා වෙනත් සාමාජිකයෙකු ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපත්වරයා විසින් පත් කළ යුත්තේය.

5. ශ්‍රී ලංකා ජන සභාවේ ස්ථාපිත කොට පවත්වාගෙන යාමේ අරමුණු පහත සඳහන් පරිදි වන්නේය.

අ) සෑම තැනැත්තෙකුට ම ජාතිය, ආගම, භාෂාව,කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යනාදී කරුණු මත කිසිඳු වෙනසකට භාජනය නොවෙමින් සිය අනන්‍යතාවය සහිතව ආත්ම ගරුත්වය සහ අභිමානයෙන් යුතුව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර පවත්වාගෙන යාම.

ආ)සෑම තැනැත්තෙකුට සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කරන ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවයන් පවත්වාගෙන යමින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට සහ රටේ සංවර්ධනයට දායක වීම.

ඇ) රටේ පවතින මානව සම්පත් සහ ස්වාභාවික සම්පත් සුරක්ෂිත කොට කළමණාකරණය කරමින් ජනතාව අතර ඇති - නැති පරතරය අවම කරගෙන සමාජ තලය සාධාරණ ලෙස බෙදෙන පරිදි සමානාත්මතාවය තහවුරු කිරීම.

ඈ) රටේ මූලික නීතිය සහ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳව ජනතාව තුළ අවබෝධයක් ඇති කිරීම.
ඉ) සමාජය නීතිගරුක බවට පත් කිරීම පුරවැසියන් සභ්‍යත්වයෙන් පිරි නීති ගරුක පුරවැසියන් බවට පත් කිරීම.

ඊ) ඉහත සඳහන් අරමුණු සාක්ෂාත්කර ගැනීම පිණිස ග්‍රාම රාජ්‍ය සංවිධාන පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

උ) ග්‍රාම රාජ්‍ය ආරම්භකර පවත්වාගෙන යාමට අවශ්‍ය නිර්ණායක සහ උපදෙස් ලබා දීම.

ඌ) ශ්‍රී ලංකා ජන සභාව සහ ප්‍රාදේශීය මට්ටමෙන් පිහිටුවා පවත්වාගෙන යනු ලබන ග්‍රාම රාජ්‍ය සමඟ අන්තර් සම්බන්ධතාව පවත්වාගෙන යමින් මෙම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීස සඳහා පියවර ගැනීම.

එ) මෙම පනතෙහි අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව රජයට උපදෙස් ලබා දීම.

6. ශ්‍රී ලංකාව තුළ පවතින ග්‍රාම සේවක වසම් අතරින් යාබදව ඇති ග්‍රාම සේවා වසම් තුනක් එකතු කර "ග්‍රාම රාජ්‍ය" නම් වූ සංවිධානයක් පිහිටවිය යුත්තේය.

7. සුවිශේෂී හේතුන් මත ග්‍රාම සේවක වසම් දෙකක් එක්කර ග්‍රාම රාජ්‍යයක් පිහිටුවිය හැකි අතර ප්‍රාදේශීය ලේකම්වරයා එම තීරණය ගැනීමේ බලධාරියා විය යුතුය.

8. ග්‍රාම රාජ්‍ය සංවිධානයට එම ග්‍රාම සේවා වසමට අදාළ නම අගට යොදා ග්‍රාම රාජ්‍ය නාමය භාවිතා කළ යුතු අතර එම ග්‍රාම රාජ්‍ය නාමයෙන් ස්ථාපිත ආයතනයක් ලෙස නඩු පැවරීමට සහ පවරනු ලැබිය හැකි නෛතික පුද්ගලභාවයක් දරන්නේය. එහි සංස්ථාපිත නාමය සහිත මුද්‍රාව සභාපති භාරයේ පැවතිය යුතුය.

9. ග්‍රාම රාජ්‍ය තුළ නිත්‍ය වාසය ඇති වයස අවුරුදු 18 ට වැඩි පවුල් ඒකකයක ගෘහ මූලිකයා හෝ ඔහු නම් කරනු ලබන පවුලේ වෙනත් සාමාජිකයෙකු හට සාමාජික මුදලක් ගෙවීමෙන් තොරව ග්‍රාම රාජ්‍ය සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත හැකිය.

10. ග්‍රාම රාජ්‍යයට සාමාජිකයන් බඳවා ගැනීම අදාළ ග්‍රාම සේවා කොට්ඨාසයේ ග්‍රාම සේවක නිලධාරියා විසින් සිදු කළ යුතු අතර මෙම පනත යටතේ පනවනු ලබන රෙගුලාසිවලට අනුව ප්‍රාදේශීය ලේකම්ගේ සහභාගීත්වයෙන් නිලධාරී මණ්ඩලයක් තෝරා පත් කර ගත යුතුය.

11. ග්‍රාම රාජ්‍යයේ සාමාජිකයන් අතරින් සභාපති,ලේකම් හා භාණ්ඩාගාරික පත් කර ගත යුතු අතර එකඟතාවක් නොමැත්තේ නම් සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුය.

12. එකී නිලධාරීන්ට අමතර ලෙස කාරක සභාව සඳහා තවත් සාමාජිකයන් 6 දෙනෙකු පත් කර ගත යුතු අතර එකඟතාවක් නොමැත්තේ නම් සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුය.

13. ග්‍රාම රාජ්‍යයේ උපදේශකයන් හයදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් විය යුතු අතර එම ග්‍රාම රාජ්‍යය තුළ පිහිටි ආගමික සිද්ධස්ථානවල නායක භික්ෂූන් වහන්සේලාට, පූජකතුමන්ලාට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

14. ඉහත කී සියලු තෝරා පත් කර ගැනීම් ප්‍රාදේශීය ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු වේ.

15. ග්‍රාම රාජ්‍යයට නිලධාරීන් තෝරා පත් කර ගැනීමේදී බහුවිධ ජන සමාජයේ සියලු කොටස් ද, තරුණ සහ කාන්තා නියෝජනය ද ප්‍රමාණවත් ලෙස සිදුවන පරිද්දෙන් කළ යුත්තේය.

16. ග්‍රාම රාජ්‍යයෙහි සියලු නිලධාරීන් සහ සාමාජිකයන් කිසිදු අයකිරීමකින් තොරව සියලු සේවාවන් ස්වෙච්ඡාවෙන් සිදු කළ යුතුය.

17. මෙම පනත යටතේ පිහිටුවනු ලබන සියලුම ග්‍රාම රාජ්‍යය පිහිටවූ දින සිට මාස තුනක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු වේ.

18. නිලධාරී මණ්ඩලයේ සිදුවන වෙනස්කමක් එම වෙනස සිදු වී මසක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු වේ.

19. පහත සඳහන් තැනැත්තන් ග්‍රාම රාජ්‍යයක නිලධාරී මණ්ඩලයේ හෝ උපදේශක තනතුරක නිලතල දැරීමට නුසුදුසු වන්නේය.

අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු,

ආ) පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු,

ඇ)පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු,

ඈ) කිසියම් දේශපාලන පක්ෂයක හෝ ශාඛාවක සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරිකයකු,

ඉ)කිසියම් අපරාධයකට අධිකරණයකින් වැරදිකරු කර සිරදඬුවම් ලබා ඇති තැනැත්තෙකු,

ඊ)වයස අවු.70 ට වැඩි අයකු (උපදේශකවරයෙකු හැර)

20. ග්‍රාම රාජ්‍යයකට පත් කර ගනු ලබන උපදේශකවරයෙකු, නිලධාරියෙකු සහ කාරක සභා සභිකයෙකු පත් වූ දින සිට වසර හතරක කාලයක් ධූර දරන්නේය.

21. ඉහත ඡේදයේ සඳහන් නිලයක් දරන්නෙකුට සිය අත්සන යටතේ ග්‍රාම සේවක වෙත යවනු ලබන ලිපියක් මඟින් ඉල්ලා අස්විය යුතුය.

22. එකී නිලධාරියකු මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ 25 වන වගන්තියේ සඳහන් යම් නුසුදුසුකමකට භාජනය වන්නේ නම් හෝ එකී හිස් වූ තනතුරෙහි ඉතිරි කාල සීමා සඳහා නව නිලධාරියකු පත්කර ගත යුතු වේ.

29. පනතේ අරමුණු ඉටුකර ගැනීමෙහි ලා කටයුතු කිරීමේ දී ;

අ) සංස්ථාපිත නාමය යටතේ ගිවිසුම්ගත වීමට,

ආ) නිශ්චල හෝ චංචල දේපළ හිමිකම සහ සන්තකය දැරීමට,

ඇ) රජයේ සහ පෞද්ගලික ආයතනයන්ගෙන් මූල්‍යමය ආධාර ලබා ගැනීමට,

ඈ) කුමන ආකාරයේ හෝ බැංකු ගිණුමක් පවත්වාගෙන යාමට,

ඉ) මුදල් ඉපයීමේ පොදු ව්‍යාපෘති ආරම්භකොට පවත්වාගෙන යාමට,

ඊ) ප්‍රාග්ධනය ලබා ගැනීමට සහ ආයෝජනය කිරීමට,

උ) කෘෂිකාර්මික, කාර්මික සහ වෙළඳ ව්‍යාපෘති ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට,

ඌ) ජනතාවගේ ජීවන මට්ටම ඉහළට ගෙන යාම සඳහා සමාජ සුභසාධක කාර්යයන් සිදු කිරීමට,

එ) සමාජයීය සහ සංස්කෘතික ගුණාංග ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීමට බලය ඇත්තේය.

30. ග්‍රාම රාජ්‍යයක අරමුණු පහත සඳහන් පරිදි විය යුත්තේ ය.

අ) ග්‍රාමය සියලු ජනකොටස් අතර සාමය සහ සංහිඳියාව වර්ධනය කිරීම.

ආ) ග්‍රාමය තුළ සියලු පවුල් ඒකකයන්හි සාමාජිකයන්ට ගෞරවනීය ලෙසත්, සුරක්ෂිත ලෙසත්, අධ්‍යාත්මික ලෙසත් ජීවත් වීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

ඇ) ග්‍රාමය තුළ වසන ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම ඇතුලු කළමනාකරණ ව්‍යාපෘතීන් පවත්වාගෙන යාම.

ඈ) රජය විසින් ග්‍රාමය තුළ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් ඇතුළු අනෙකුත් ව්‍යාපෘතී සම්බන්ධයෙන් ප්‍රමුඛතාවන් හඳුනාගෙන උපදෙස් ලබා දීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි ලා සහාය වීම.

ඉ) අපරාධ, දුරාචාර, මත්ද්‍රව්‍ය භාවිතය මැඩලීම සඳහා පොලීසිය ඇතුළු නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ එම ආයතන වලට සහාය දැක්වීම.

ඊ) හදිසි අවස්ථාවල දී සහ ආපදා අවස්ථාවල දී ග්‍රාමයෙහි ජනතාවගේ උපරිම ආරක්ෂාව සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

උ) අධ්‍යාත්මික ගුණ වගාව සඳහා ළමා සහ තරුණ පරපුර ධෛර්යමත් කිරීම සහ දහම් අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම.

ඌ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

එ) ග්‍රාමයෙහි ජනතාව තුළ මතුවන ගැටුම් සහ මත ගැටුම් සමනයකර සාමය සහ සමඟිය ආරක්ෂා කිරීම.

ඒ) ග්‍රාමයෙහි ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක කමිටු ක්‍රියාත්මක කිරීම.

ඔ) ග්‍රාමයෙහි පොදු කටයුතු වෙනුවෙන් ශ්‍රමදාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ඕ) ඉහත කී අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

31. ග්‍රාම රාජ්‍ය විසින් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට තීරණය කළ ව්‍යාපෘතීන් සඳහා සාමාජිකයන් අතුරෙන් කමිටු පත් කිරීමට නිලධාරි මණ්ඩලයට බලය ඇත්තේය.

32. ග්‍රාම රාජ්‍යය සංවිධානයේ රැස්වීම් සහ සාකච්ඡා සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන භාෂා එකකින් හෝ වැඩි ගණනකින් පවත්වාගෙන යා හැකි අතර එම සංවිධානය විසින් එකඟවන පරිදි එය සිදුකළ යුත්තේය. එම ආකාරයෙන්ම ඉහත කී කුමන හෝ භාෂාවකින් රැස්වීම් වාර්තා පවත්වාගෙන යා හැකිය.

33. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අවස්ථානෝචිත පරිදි යාබදව පිහිටි ග්‍රාම රාජ්‍ය සංවිධාන දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වී ක්‍රියාත්මක කළ හැකි අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය ඇතිව වඩිමත් පූර්ව ගිවිසුම් ගතවීමක් සිදුකළ යුතු ය.

34. ග්‍රාම රාජ්‍ය විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුම් පිළිබඳ වාර්තාවක් තුන් මසකට වරක් ග්‍රාම සේවක නිලධාරි මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර වසර අවසානයේ වාර්ෂික ගිණුම් වාර්තාව ඉදිරිපත් කළ යුතු ය. එය විගණනයට ලක්කළ යුතු ය.

35. මෙම පනතේ කාර්යයන් සඳහා;

'ග්‍රාමසේවක වසම' යන්නට රාජ්‍ය පරිපාලනය සඳහා නිශ්චය කරගෙන ඇති ග්‍රාමසේවක වසමක් අදහස් වේ.

'ප්‍රාදේශීය ලේකම්' යන්නට අදාළ ග්‍රාම රාජ්‍ය පිහිටි ප්‍රදේශය අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අදහස් වේ.

'ගෘහ මූලිකයා' යන්නට පවුල් ඒකකයක ප්‍රධානියා අදහස් වේ.